" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත

பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்

OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

SLSI SYSTEM CERTIFIED ISO 9001

මගේ අංකය / எனது இலக்கம் / My No. **CSWP/PTR/21-3/FI/1(C)**  ඔබේ අංකය / உமது இலக்கம் / Your No.  දිනය / திகதி / Date **2023.03. 31**

<u>බහුකාර්ය සංවර්ධන සහායකයින් වෙත ස්ථිර පත්වීම් ප්‍රදානයට අදාළව මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ නිවේදනය - දෙවන අදියර</u>

බස්නාහිර පළාත් සභාවට අනුයුක්තව සේවයේ නියුතු බහුකාර්ය සංවර්ධන කාර්ය සහායකයින් වෙත ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට අදාළව මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයන් <u>2023.04.05 (බදාදා) සහ 2023.04.07 (සිකුරාදා) යන දිනයන් හිදී, අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල ලිපිනයෙහි පිහිටා ඇති බස්නාහිර පළාත් සභා සංකීර්ණයේ දී පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර ඇත.</u>

02. ඒ අනුව, එම සම්මුඛ පරීක්ෂණය සඳහා මේ සමඟ ඇති නාම ලේඛනයෙහි නම් සඳහන් බහුකාර්ය සංවර්ධන සහායකයින් හට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන් හිදී නියමිත වේලාවට නියමිත මහලෙ හි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත පහත ලිපි ලේඛන ද රැගෙන සහභාගී වන ලෙස මෙයින් දන්වා සිටිමි.

I. බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක තනතුරට පත් කරන ලද පත්වීම් ලිපියේ මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපතක්
II. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (DS 04)
III. දැනට සේවයේ නියුතු බවට ආයතන ප්‍රධානියාගේ සහතිකය (ඇමුණුම 1)
IV. උප්පැන්න සහතිකයේ මුල් පිටපත හා සහතික කරන ලද ඡායා පිටපත
V. ජාතික හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය හා සහතික කරන ලද ඡායා පිටපත
VI. NVQ 03 වන මට්ටම සම්පූර්ණ කල පුහුණු සහතිකයේ මුල් පිටපත හෝ NVQ 03 වන මට්ටම සම්පූර්ණ කරන ලද බවට සනාථ කිරීමේ ලේඛනය හා සහතික කරන ලද ඡායා පිටපත

** **(NVQ සහතිකයේ පිටපතක් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ (NAITA) වෙබ් අඩවියෙන් බාගත කොට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට රැගෙන ආ යුතුය.)**

VII. වෘත්තීය සුදුසුකම් වලට අදාල සහතික වල මුල් පිටපත් හා සහතික කරන ලද ඡායා පිටපත්
VIII. ඉදිරිපත් කරනු ලබන ලිපි ලේඛන වල නමෙහි වෙනසක් ඇත්නම් එම වෙනසට අදාල දිවුරුම් ප්‍රකාශය
IX. බස්නාහිර පළාත් සභාවේ ස්ථිර පත්වීම් ලබාගත් පසුව, අනුයුක්ත කරනු ලබන සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 05ක් සේවයේ නිරත වන බවට දිවුරුම් ප්‍රකාශය (ඇමුණුම 2)
X. මාස 06ක් ඇතුළත ලබාගත් චරිත සහතික 02 ක්
XI. පිරික්සුම් ලේඛනය (ඇමුණුම 3)

03. ඉහත ලේඛන ඇමුණුම 03හි පරිදි සකස් කර ගත් පිරික්සුම් ලේඛනය මුලට සිටින පරිදි එහි සඳහන් <u>පිළිවෙලට ලේඛනවල ඡායා පිටපත් පමණක් අමුණා රැගෙන ආ යුතුය.</u>

ඩබ්ලිව්.ටී.ඒ.මානෙල්
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)**
ප්‍රධාන ලේකම් වෙනුවට
බස්නාහිර පළාත